සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව(බ.ප),
ආදිපාද වීදිය, කොළඹ 01.

2023.03.21

සියලුම සමුපකාර සංවර්ධන නිලධාරීන් වෙත,

**බස්නාහිර පළාතේ සමුපකාර සමිති ප්‍රඥප්තියට අනුව ආරවුල් බේරුම්කරණයට අදාළ නියමයන්**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් නිකුත් කර ඇති 2023.01.09 දිනැති 01/2023 චක්‍රලේඛයේ 4.18 වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

**4.18 ප්‍රදානය සඳහා මුදල් ගෙවීමේ කාලය නියම කිරීම**

බේරුම්කරුවෙකු හෝ බේරුම්කාර මණ්ඩලයක් හෝ විසින් දෙනු ලබන ප්‍රදානයක මුදල් ගෙවීම සඳහා කාලයක් නියම කිරීමට දැනට පවත්නා නීති මූලාශ්‍රවල නිශ්චිතව සඳහනක් නැත. බේරුම්කරුවන් විසින් ප්‍රදානයේ සඳහන් මුදල ගෙවීමට කාලය පදනම් කරගෙන ඇත්තේ අභියාචනා කාලසීමාවයි. එහෙත් එම කාලසීමාව තුළ මුදල් ගෙවීමට කැමැත්ත තිබුණද ප්‍රායෝගික නොහැකියාවන් ඇති අවස්ථා දක්නට ලැබේ. නියම කරන ලද දිනයට මුදල් නොගෙවූ අවස්ථාවල එම ප්‍රදාන බලාත්මක කිරීම සඳහා අධිකරණයට යොමුකල යුතුව ඇත. අධිකරණයට ඉදිරිපත් වන බලගැන්වීමේ නඩු ප්‍රමාණය වැඩිවේ. එයට පිළියම් වශයෙන් පහත සඳහන් වගුව අනුව බේරුම්කරුවෙකු හෝ බේරුම්කාර මණ්ඩලයට, සහකාර කොමසාරිස්වරයාට ප්‍රදානයේ සඳහන් මුදල් එකවර හෝ වාරික වශයෙන් හෝ ගෙවීමට නියම කළ හැක. එහෙත් මෙය ප්‍රදානයේ කොටසක් ලෙස නොසැලකිය යුතුය. හේතුපාඨ හා ප්‍රදානය ප්‍රකාශයට පත්කර පාර්ශවයන්ගෙන් අත්සන් ලබාගත් පසු පහත වගුවට අනුව මුදල් ගෙවිය යුතු කාලය විභාග වාර්තාවේ සටහන් කර ප්‍රකාශ කල යුතුය. මෙම කාලසීමාව තුල බේරුම්කරු විසින් නියම කරනු ලබන පොළියද ගෙවිය යුතු බව වැඩිදුරටත් ප්‍රකාශ කල යුතුය.

| තනතුර | මුදල් සීමාව | කාල සීමාව |
|---|---|---|
| බේරුම්කාර මණ්ඩලය/ බේරුම්කරු | රු. 500,000.00 දක්වා | දින 60 |
| | රු. 500,001.00 සිට රු.1,000,000.00 දක්වා | දින 90 |
| | රු.1,000,001.00 සිට රු. 2,500,000.00 දක්වා | දින 180 |
| | රු. 2,500,000.00ට වැඩි | දින 365 |

එකුදු වුවත් යම් ආරවුල් විභාගයකදි පාර්ශවයන් නොපැමිණීම නිසා එකපාර්ශිකව විභාගයක් පවත්වා ප්‍රදානයක් දීමට සිදු වුවහොත් එහි වටිනාකම නොසලකා දින 60 ක කාලයක් පමණක් දිය යුතුය.

රුවිනී ඒ. විජයවික්‍රම
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ත්‍රාර් (වැ.බ)
බස්නාහිර පළාත.